පසුගිය දින කාන්තාවක් ඝාතනය වීමේ සිදුවීමේ සමාජ පසුවිපරමක්, "මියගිය ඥතුමා සහ ජීවත්වන ඥාතිමාලා රටට කියන කතාව" යන සිරස්තලයෙන් යුතුව දිවයින ඉරිදා සංග්‍රහය (11/14) තුළ පළ වී තිබිණි.

එම ලිපියේ සඳහන් වූ ඇතැම් කරුණු පාඨක අවධානයට යොමු වීම වටී.

"...මෙම මරණයත් සමගින් මුස්ලිම් කාන්තාවන්ගේ සමාජ විරෝධී ක්‍රියාකාරකම් රැසක් සමාජයට දැනගන්නට ලැබුණි... බහුතරයක් සිතා සිටිනුයේ මුළු ශරීරයම වැසෙන ලෙස ඇඳුම් ඇඳගෙන සිටින මුස්ලිම් කාන්තාවන් ඉතා අහිංසක බවයි. එහෙත් එසේ නොමැත. බහුතරයක් මුස්ලිම් කාන්තාවන් එම ඇඳුමට සහ ආගමට මුවාවී සමාජ විරෝධී කටයුතු වල නියැලෙති" යනාදී වශයෙන් මුස්ලිම් කාන්තාවන් සෘණාත්මකව ඒකාකෘතික කෙරෙනා (stereotyping) අදහස් කිහිපයක්ම එම ලිපිය තුළ දක්නට ලැබිණි.

1) යම් හුදෙකලා සිදුවීම් පදනම් කරගනිමින්, මෙසේ එක් ආගමක් හෝ ජාතිකත්වයක් සෘණාත්මක ඒකාකෘතික කිරීම කෙතරම් දුරට යෝග්‍ය වන්නේ යැයි ඔබ සිතන්නේ ද?

2) එය වාර්ගිකත්වය සහ ආගම අනුව වෙන් වන ප්‍රජාවන් අතර අසමගියක් ඇති වීමට පවා තුඩු නොදෙනු ඇති ද?

3) ඒ අනුව මෙම ලිපිය එවැනි ඒකාකෘතික කිරීම් වලින් තොරව ඉදිරිපත් වූයේ නම්, එය මාධ්‍ය ආචාර ධර්මයන්ට වඩාත් අනුකූල වනු ඇතැයි ඔබ නොසිතන්නේ ද?

ඔබේ අදහස?